# Regional Development Disparities and Future challenges of Sri Lanka

**Nishan Sakalasooriya**

**Senior Lecturer**

**Department of Geography**

**University of Kelaniya**

**Sri Lanka**

**nishan@kln.ac.lk**

## ප්‍රාදේශීය සංවර්ධන විෂමතා සහ ශ්‍රී ලංකාවේ අනාගත අභියෝග

**නිශාන් සකලසූරිය**

**ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භූගෝල විද්‍යා අධ්‍යයනාංශය**

**කැලණිය විශ්වවිද්‍යාලය**

**ශ්‍රී ලංකාව**

**nishan@kln.ac.lk**

ලෝකයේ වර්තමානයේ දී රටවල් අතරත්, රටවත් තුළත් ප්‍රදේශ අතර සංවර්ධන විෂමතාවයන් පුළුල් වෙමින් තිබේ. ආර්ථිකය, දේශපාලනය, තාක්ෂණය, අධ්‍යාපන හා සංස්කෘතින් ආදී බොහෝ දේ ගෝලීයකරණය වන්නා සේ ම. ලෝක ජනතාවගේ ගැටලු හා අර්බුදයන් ද ගෝලීයකරණය වෙයි. ඒ අනුව 21 වන දියවසේ දෙවන දශකයට පිවිස සිටින ලෝක ජනතාව ඔවුන්ගේ ඓතිහාසික උරුමයක් වශයෙන් හා වැරදි ගෝලීයකරණයේ හා තාක්ෂණයේ ප්‍රතිඵල වශයෙන් ප්‍රධාන ගැටලු හා අර්බුද රාශියකට මුහුණ පා ඇත. ප්‍රධාන වශයෙන්,

- ♦ වායුගෝලීය උණුසුම ඉහළ යාම
- ♦ දේශගුණ වෙනස්වීම්
- ♦ ස්වභාවික උපද්‍රව ඉහළ යාම
- ♦ තාක්ෂණික උපද්‍රව වර්ධනය වීම
- ♦ සාගින්නෙන් පෙළෙන ජන සංඛ්‍යාව වර්ධනය වීම
- ♦ දුප්පතුන්ගේ සංඛ්‍යාව වර්ධනය වීම
- ♦ ත්‍රස්තවාදය වර්ධනය වීම
- ♦ බලවත් රාජ්‍යයන් රටවල් ආක්‍රමණය කිරීම (විවිධ උපක්‍රම මගින්

- මැදපෙරදිග හා උතුරු අප්‍රිකාවේ සිදුවන බලහත්කාරී යුධමය ක්‍රියාමාර්ග
- ගෝලීය ආර්ථිකය කඩා වැටීම

එමෙන්ම එක්සත් ජාතීන් ම පෙන්වන පරිදි සහස්‍ර සංවර්ධන අර්බුද හෙවත් ඉලක්ක 8 ක් ද වෙයි. මේ ආදී සෑම කරුණකින් ම පැහැදිලි වන්නේ ලෝක ජනතාවගෙන් අතිමහත් බහුතරය දැඩි පීඩාවකින් ජීවත්වන බවය. මෙම තත්ත්වයන් පොදු ලෙස සලකා ගෙන ඒවාට ප්‍රධානතම හේතු හඳුනාගතහොත් එය ප්‍රධාන කොටස් 2 කට ගොනු කළ හැකිය.

1. රටවල් අතර හා රටවල් තුළ ප්‍රදේශ අතර මතුව තිබෙන සංවර්ධන විෂමතා පුළුල් වීම හා ඒවා ජාතිකත්වය, ආගම හා වෙනස් සංස්කෘතික සාධක මත හඳුනාගැනීමෙන් මතුව ඇති ගැටලු හා අර්බුද

2. ගෝලීය හා ප්‍රාදේශීය පාරිසරික අර්බුද

ඉහත සඳහන් කරනු ලැබූ අභියෝග ද්විත්වය අඩුවක් නැතිව හා වෙනස් අයුරින් ශ්‍රී ලංකාවේ ද විද්‍යමාන වේ. මෙම අර්බුද දෙකෙන් පළමුවැන්න අතිශයින් භයානක ය. මන් ද යත් ලෝකයේ බලය විමධ්‍යගත කිරීම, බලය බෙදා හැරීම හා බලය සංකේන්ද්‍රණය කිරීම ආදී විවිධ ක්‍රියාමාර්ග යටතේ දේශීය හා විදේශීය වශයෙන් ශ්‍රී ලංකාවේ ජාතික සමගිය හා රාජ්‍යයේ ඒකීයත්වයට හානි පැමිණවීමටත්, එමගින් ශ්‍රී ලාංකේය ජනතාවගේ අනාගත අභියෝගයට ලක් කිරීමට වැඩි හැකියාවක් පැවතීම ය. මෙම ලිපියේ අරමුණ ශ්‍රී ලංකාවේ දිගු කාලයක සිට පවතින ප්‍රාදේශීය සංවර්ධන විෂමතාවයෙහි වර්තමාන තත්වය පැහැදිලි කිරීමත්, එයට පාදක වෙමින් අතීතයේ ගනු ලැබූ ක්‍රියාමාර්ග හා වර්තමානයෙන් අනාගතයට ගමන් කරන විට ශ්‍රී ලංකාව රාජ්‍යයක් හා ජනතාවක් හැටියට මුහුණපාන අභියෝග පැහැදිලි කිරීමත් ය.

රටවල් අතර හා රටවල් තුළම පවත්නා සංවර්ධන අසමානතා කෙරෙහි ප්‍රධාන හේතු 4 ක් බලපායි.

1. පාරිසරික හේතු
2. සමාජීය හා සංස්කෘතික වෙනස්කම්
3. ඓතිහාසික බලපෑම්
4. දේශපාලන ක්‍රමවේද හා ප්‍රතිපත්ති

මෙකී හේතු නිසාවෙන් ලෝකයේ ප්‍රදේශ අතර සංවර්ධන විෂමතා නිරූපණය වේ. උදාහරණ වශයෙන් ලෝකයේ සංවර්ධිත රටවල් හෙවත් පැරණි කාර්මික රටවල් 34 ක් පමණ ජීවත්වන ලෝකයේ ජනතාවගෙන් 18% ක් පමණ වූ පිරිසක් ලෝක සම්පත්, ආදායමෙන් හා නිෂ්පාදනයෙන් 80% කටත් වඩා

වැඩි භුක්තියක් ලබයි. ඒ අනුව ලෝක බැංකුව හා ජාත්‍යන්තර අරමුදල, එක්සත් ජාතීන්ගේ සංවිධානය වැනි සුපිරි ජාතික (Supra National) සංවිධාන ලෝකයේ රටවල් විවිධ අයුරින් හඳුනාගෙන ප්‍රාදේශීයකරණයකට ලක්කොට ඇත.

ඒ අනුව,

1. සංවර්ධිත රටවල් හෙවත් පැරණි කාර්මික රටවල්
2. සංවර්ධනය වන රටවල් හෙවත් ඌණ සංවර්ධිත රටවල්
    i. නව කාර්මික රටවල්
    ii. ඛනිජ තෙල් අපනයනය කරන රටවල්
    iii. ගොඩබිමින් වට වූ රටවල්
    iv. කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රමුඛ අපනයනය කරන රටවල්
    v. අඩුම සංවර්ධනයක් සහිත රටවල් හෙවත් වඩාත්ම දුප්පත් රටවල්

එමෙන්ම ලෝක බැංකුවට අනුව ලෝකයේ රටවල් ප්‍රධාන කාණ්ඩ 4 කට බෙදෙයි.

1. ඉහළ ආදායම් ලබන රටවල්
2. ඉහළ මධ්‍යම ආදායම් ලබන රටවල්
3. පහළ මධ්‍යම ආදායම් ලබන රටවල්
4. පහළ ආදායම් ලබන රටවල්

මීට අමතරව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංවර්ධන වැඩසටහන (UNDP) මගින් 1980 සිට ප්‍රකාශයට පත් කෙරෙන මානව සංවර්ධන වාර්තාවට (HDR) අනුව එහි සාමාජික රටවල් ලබා ඇති තත්වය පැහැදිලි කෙරේ. එට අනුව ශ්‍රී ලංකාව රටවල් 186 කින් 91 වන ස්ථානය (2009) හිමි කරගෙන සිටී.

මේ සියළු බෙදීම් මගින් තහවුරු වන හා අවධාරණය කළ යුතු වැදගත්ම දෙය නම් ලෝකයේ ජීවත්වන එකම මානව විශේෂය වන හෝමෝ සේපියන්ස් සේපියන්ස් හෙවත් වඩාත් බුද්ධිමත්ම මානවයාගේ ජීවන තත්වය මත කාණ්ඩ කෙරී ඇති බවත්, ඔවුන් ජීවත් වන ප්‍රදේශ වෙන වෙනම පැහැදිලිව හඳුනාගත හැකි බවත්ය. ඒ අනුව සංවර්ධන ජාතීන් සංවර්ධනයෙන් ඉහළ හර ප්‍රදේශයේ හෙවත් කේන්ද්‍රීය රටවල ද දුප්පත් හෙවත් සංවර්ධනය වන ජාතීන් පර්යන්ත රටවල හෙවත් පරිධියේ රටවල ද ජීවත් වේ. දේශගුණය පදනම් කොට බැලූ විට දියුණු යයි සම්මත ජාතීහු සෞම්‍ය දේශගුණික කලාපයේ ද සංවර්ධනය වෙමින් පවත්නා දුප්පත් ජාතීහු නිවර්තන හෙවත් ඝර්ම කලාපීය රටවල ද ජීවත් වෙති.

මෙවැනි ප්‍රාදේශීය සංවර්ධන අසමානතා හේතුවෙන් මතු විය හැකි ගැටලු හා අර්බුද කිහිපයකි.

1. ජාතික ආර්ථික වර්ධනය පසු බැසීම
2. ප්‍රාදේශීය සම්පත් විෂමතා කෙරෙහි අවධානයක් නොවීම
3. ප්‍රාදේශීය ගැටලු උග්‍ර වීම
4. රටවල් තුළ මහජන නැගිටීම්, උද්ඝෝෂණ, කැරළි ත්‍රස්තවාදය හා සිවිල් යුධ ගැටුම් වර්ධනය වීම
5. ප්‍රදේශ බෙදා වෙන් කොට පාලනය කිරීමට අවශ්‍ය බලය බෙදාහැරීම, බලය විමධ්‍යගත කිරීම, බලය මුදා හැරීම හා වෙනම රාජ්‍ය සංකල්ප දක්වා වර්ධනය වී බෙදුම්වාදය ජාතික ගැටලුව බවට පත්වීම
6. ස්වභාවික පරිසරයේ මතුවන විවිධාකාර වර්ගයේ ගැටලු

අවසාන වශයෙන් ප්‍රාදේශීය සංවර්ධන විෂමතා වර්ධනය වීම හේතුවෙන් එම රටවල් වල මානව හිමිකම හා ප්‍රජාතන්ත්‍රවාදය හා සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක කිරීමට අපහසු තත්වයක් පැන නැගී එක පිට එක හේතු මත මානව ජන ජීවිතය අවුල් වී යනු ඇත. නොඑසේ නම් ප්‍රාදේශීය ගැටලු ක්‍රමයෙන් උත්සන්න වී ජාතික අර්බුදය දක්වා විකසනය වේ. ඒවා ප්‍රාදේශීය සංවර්ධන අසමානතා ඇති වන කොයි රටටත් පොදුය. උතුරු අයර්ලන්තය, පිලිපීනයේ මින්දනාවෝ, ඉන්දියාවේ ඊසාන දිග ඇසැම් හා වයඹදිග කාෂ්මීර ප්‍රදේශය ඉරාකය, ඇෆ්ගනිස්ථානය, පලස්තීනය, කොසෝවෝ, ටිමෝරය, සූඩානය, ඊජිප්තුව, එරිත්‍රියාව, සයිප්‍රසය, යේමනය, ඊජිප්තුව, උතුරු හා දකුණු කොරියාව ආදිය මෙවැනි අසහනකාරී තත්වයන් බෙදා වෙන් කිරීමේ අවස්ථාව දක්වා වර්ධනය වූ රටවලට උදාහරණ ය.

## ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන අසමානතා

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයේ වර්තමාන තත්වය විමසීම, අතිශයින් වැදගත් වන අතර එමගින් ශ්‍රී ලංකාවේ අනාගත අභියෝග පිළිබඳව අවබෝධයකට මග පාදනු ඇතැයි විශ්වාස කරමි. පහත දැක්වෙන වගුවෙන් ශ්‍රී ලංකාවේ පළාත් අතර දක්නට ලැබෙන සංවර්ධන විෂමතාවයන් පැහැදිලි වේ.

| අංක 1 වගුව ශ්‍රී ලංකාවේ පළාත් අනුව සංවර්ධන විෂමතා | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| පළාත | විශාලත්වය (අක්කර) | මුළු භූමි ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස | ජනසංඛ්‍යාව(2010) | | දළ දේශීය නිෂ්පාදනයට දායකත්ව | ඒක පුද්ගල ආදායම රුපියල් (2009) | දරිද්‍රතාව (ප්‍රතිශතය) | නිෂ්පාදන කර්මාන්ත වල දායකත්වය |
| බස්නාහිර | 369,420 | 5.7 % | 5865000 | 28.40% | 50.1 % | 222,598 | 8.2 | 72.4 % |
| සබරගමුව | 491,650 | 7.5% | 1943000 | 09.44% | 6.2 % | 82,575 | 24.2 | 1.2% |
| දකුණු | 555,960 | 8.5 % | 2494000 | 12.12% | 9.3 % | 97,377 | 13.8 | 4.7 % |
| මධ්‍යම | 558,970 | 8.6 % | 2689000 | 13.7% | 8.8% | 85,833 | 22.3 | 8.6 % |
| වයඹ | 781,200 | 12.0 % | 2342000 | 11.38% | 9.3 % | 103,792 | 14.6 | 2.9 % |
| ඌව | 848,130 | 13.0 % | 1326000 | 6.44% | 4.6 % | 92,615 | 27 | 1.4 % |
| උතුරු | 888,460 | 13.6 % | 1193000 | 5.8% | 2.9 % | 64,185 | no data | 5.4 % |
| නැගෙනහිර | 979,220 | 15.0 % | 1561000 | 7.59% | 4.7 % | 75,364 | 10.8 | 2.5 % |
| උතුරු මැද | 1,051,180 | 16.1 % | 1240000 | 6.0% | 4.1 % | 88,333 | 14.2 | 1 % |
| ශ්‍රී ලංකාව | 6,524,190 | 100% | 20,653,000 | 100% | 100 % | 1O648 5 | 15.2 | 100 % |

***Compiled by Nishan Sakalasooriya   Data Source: Central Bank and Dept. Census Reports, Sri Lanka***

## Income distribution (b)

Gini coefficient of household income (2009/2010) : 0.47
Mean household income (2009/2010) : Rs. 35,495 per month
Median household income (2009/2010) : Rs. 24,106 per month

අංක 1 වගුවෙන් දැක්වෙන තොරතුරු මගින් දැක්වෙන ආකාරයට ශ්‍රී ලංකාවේ කුඩාම පළාත එනම් බස්නාහිර පළාත ශ්‍රී ලංකාවේ මුළු භූමි භාගයෙන් 5.7% ක් නියෝජනය කරන අතර ද.දේ.නිෂ්පාදනයට 51.1% කින් දායකත්වය සපයයි. නිෂ්පාදන කර්මාන්ත වලින් 72.4% බස්නාහිර පළාතට සංකේන්ද්‍රණය වී ඇති අතර දැනට ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අපනයන සැකසුම් කලාප 6 න් 5 ක් ම පිහිටා ඇත්තේ ද බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගුවන් තොටුපල, වරාය, පරිපාලන හා


වාණිජ අගනුවර සියල්ල බස්නාහිර පළාතට සීමා වීම මෙම සශ්‍රීකත්වය මග පාදා ඇත. මේ සඳහා ඓතිහාසික සාධක හා රාජ්‍ය ප්‍රතිපත්ති සෘජුවම බලපා ඇත.

මෙවැනි අනෙක් අන්තය කෙබඳුද? මෙම දත්ත පරීක්ෂා කිරීමේදී බස්නාහිර පළාත් ඒක පුද්ගල වාර්ෂික ආදායම රුපියල් 222,595 (2009) වන අතර උතුරු හා නැගෙනහිර පළාතේ පිළිවෙලින් රු. 64185 හා රු. 75,364 වේ. එහම පළාත් වල කර්මාන්ත පිහිටා ඇත්තේ පිළිවෙලින් උතුරේ 5-4 ක් ද නැගෙනහිර පළාතේ 2.5% ක් වශයෙනි. නමුත් කර්මාන්ත වල ව්‍යාප්තිය දකුණ වයඹ, සබරගමුව හා උතුරු මැද කර්මාන්ත සංඛ්‍යාව උතුරු හා නැගනහිරට වඩා අඩු වන නමුත් ඒක පුද්ගල ආදායම වැඩි ය. එයට හේතු කෘෂිකර්මය හා සේවා අංශයේ සිදුවන ප්‍රසාරණයයි. ඒ අනුව ඒ ඒ පළාත් අතර පවතින සංවර්ධනයේ විෂමතාවය සුළු පටු නොවේ. උදාහරණ වශයෙන් ශ්‍රී ලංකාවේ වාර්ෂික මධ්‍යන්‍ය ඒක පුද්ගල ආදායම ඉක්මවා ආදායම් ලබන්නේ බස්නාහිර පළාත පමණි. නමුත් අනෙක් පළාත් වල ද සුළු පිරිසක් එම ආදායමට වඩා ආදායම් ලබයි. බස්නාහිර පළාතේ ද ඉහළ ආදායමක් ලබන අය සීමිතය. මෙහිදී පෙනෙන්නේ ශ්‍රී ලංකාවේ පවතින ආදායම් ව්‍යාප්තිය විෂමතාවේ බරපතල තත්වයයි. එය කොතරම් ද කියනවානම් ශ්‍රී ලංකාවේ පොහොසත්ම 20% ශ්‍රී ලංකාවේ දළ දේශීය ආදායමෙන් 52% ක් හිමි කරගන්නා අතර දුප්පත් 20% හිමි කරගනුයේ 4.1% කත් තරම් අඩු අගයකි. ශ්‍රී ලංකාවේ සහස්‍ර සංවර්ධන අභිමතාර්ථ වාර්තාවේ මේ පිළිබඳව විස්තර අන්තර්ගතය.


ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධන අසමානතාව නිදහසට පෙරත් පැවති අතර එම යුගයන්හි දී ද ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ගැටුම් උත්සන්න වීමට එය හේතු විය. රජරට රජු විසින් ම පාලනය කළේය. ඒ නිසා අනෙකුත් යුව රජවරුන් පාලනය කළ සමහර ප්‍රදේශ පසුගාමී විය. ඒ නිසා එළාරගේ පාලනයට එරෙහිව දකුණෙහි සිට ගැමුණු කුමාරයා සටන් කොට එම නරපතියා දේශපාලනිකව වෙන් කළ අතර සංවර්ධන අසමානතාව අවම නොවීය. ඒ නිසා රජවරුන් අතර ගැටුම් දිගින් දිගටම වර්ධනය විය. මහා පරාක්‍රමබාහු රජතුමා ද රට එක්සේසත් කරනු ලැබුවත් පොළොන්නරු රාජධානියට සෑම දෙසින් ම සතුරු ආක්‍රමණ එල්ල වූයේ රටේ අනෙකුත් ප්‍රදේශ වල පැවති අන්ත පසුගාමී තත්වයන්ට පිළිතුරු නොදීමේ හේතුවෙනි. විජයබා කොල්ලයට ද හේතුව අසමාන සම්පත් බෙදීයාම හා සංවර්ධනයේ ප්‍රාදේශීය අසමානතාවයන්ය.

යුරෝපීයන්ගේ පාලන සමයේදී සංවර්ධනය සිදු වූයේ අප රටේ අවශ්‍යතා සපුරාලීමට හෝ ලංකාවේ අභිවෘද්ධිය පිණිස නොවේ. ඒ නිසා වරාය හා නගර පදනම් කරගත් සංවර්ධනයක් ද ඊට සරිලන අපර ව්‍යුහ සංවර්ධනයන් ද ලංකාවේ ඇති කරමින් ප්‍රාදේශීය සංවර්ධන අසමානතා තවත් පුළුල් කළේය. ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමාගේ අත්තනෝමතික පාලනය හේතුවෙන් රට තුළ සංවර්ධන විෂමතා පුළුල් වී ගියෙන් තම ප්‍රතිවාදියාට මුහුණදීමට සිංහල නායකත්වය යටතේ බ්‍රිතාන්‍යන්ට රට පාවා දීමට ද කටයුතු කළේ ඔවුන් මෙම රටේ සමතුලිත සංවර්ධනයක් කරනු ඇතැයි විශ්වාසයෙනි. නමුත් 1818 දීම බ්‍රිතාන්‍යයට විරුද්ධව මිනිසුන් සටන් කළේ උක්ත අරමුණු ඔවුන්ගෙන් ද ඉටු නොවුනු නිසාය.

නිදහසට පසුව ශ්‍රී ලංකාවේ බලයට පත් විවිධ ආණ්ඩු හා ඒවායේ ප්‍රතිපත්තින් මගින් තවදුරටත් ප්‍රදේශ අතර අසමානතාව පුළුල් කළේය. 1971 දී ශ්‍රී ලංකාවේ ග්‍රාමීය නාගරික ප්‍රදේශ සංවර්ධන විෂමතා මුල් කොට ගෙන ඇති වූ මහජන නැගිටීම ද 1956 දී දෙමළ ජාතීන් විසින් ශ්‍රී ලංකාවේ 50 ට 50 ඉල්ලීම ද එය වර්ධනය වී 1980 දශකයේ මුල් භාගයේ ඇති වූ දෙමළ ජනතාවගේ නැගිටීම් වලට ද ප්‍රධානම හේතුව වූයේ ප්‍රදේශ අතර සංවර්ධන අසමානතාව ඇති වීමයි. එතැන් සිට බලයට පත් ආණ්ඩු සමඟ එල්ටීටීඊ සංවිධානය ත්‍රස්තවාදී කටයුතු මගින් යුධමය ගනුදෙනුවකට මුල පිරී ය. එහි ප්‍රතිවිපාක අප කාටත් හොඳින් වැටහී ඇත. අවසනදී ඔවුන් වෙනම රාජ්‍ය සංකල්පයක් ද ඒ සඳහා සිතියම් ද අනෙක් අවශ්‍යතා ද ක්‍රමයෙන් ජයග්‍රහණය කරමින් තිබියදී මෙරටේ සියලු බලවේග වල එකතුවෙන් මීට වසර දෙකකට පමණ පෙර බෙදුම්වාදයේ යුධමය වශයෙන් තාවකාලිකව පරාජයට පත් කොට තිබේ. නමුත් ලෝක අධිරාජ්‍යවාදීන් හා ඉන්දියානු ව්‍යාප්ත වාදය මගින් අදත් ශ්‍රී ලංකාවට නැවත නැවත බලපෑම් කරමින් තිබේ. ශ්‍රී ලංකාව දරුස්මාන් වාර්තාව මගින් ද ඉන්දියානු ගිවිසුම් මගින් ද සීමාවට පත් කොට තිබේ. යුද්ධය අවසාන වී සෑහෙන කලක් ගත වී ඇතත් ශ්‍රී ලංකාව අඩු වශයෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශ වල පවතින මූලික අවශ්‍යතා සම්පාදනය කරමින් ජීවන තත්වය වර්ධනය කිරීමට පියවර නොගැනීම බරපතල ගැටලුවකි. වරාය, ගුවන් තොටුපොල මහා සංවර්ධන ව්‍යාපෘති තවමත් සිංහල බහුතරය සිටින ප්‍රදේශ වලට කේන්ද්‍රගතය. ප්‍රදේශ අතර අසමානතාවය ජාතියත්, ආගමත්, කුලය හෝ වෘත්තිමය වශයෙන් ප්‍රකාශ වීමට හැකිය. ඒ නිසා ශ්‍රී ලංකාවේ එය ප්‍රකාශ වී ඇත්තේ දෙමළ භාෂාව කතා කරන ජනතාව ජීවත් වන උතුරු නැගෙනහිර හා මධ්‍යම කඳුකරයේය.




**මූලාශ්‍රයඃ නිදහස් ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රගතිය 1998**




මේ සියලු සාධක සලකා බලන විට ශ්‍රී ලංකාව ප්‍රධානම අභියෝගය නැවත හිස ඔසවන බෙදුම් වාදයයි. එය පාදක වී ඇත්තේ ප්‍රදේශ අතර අසමානතාවයයි. බෙදුම්වාදයට සමගාමීව රටේ විවිධ ප්‍රදේශ වලින් මතුවන විරෝධතා, අර්බුධ , උද්ඝෝෂණ හා උපවාස වල මූල කේන්ද්‍රය ප්‍රාදේශීය සංවර්ධනය හා බැඳී පවතී.

මෙම තත්වය වෙනස් කළ හැක්කේ කෙසේද? මෙවැනි තත්වයන් මතුවීම වළක්වනු පිණිස 1930 ගණන් වල සිටම ලෝකයේ විවධ ප්‍රදේශ වල විද්වතුන් හා වෘත්තිකයන් ප්‍රවේශ හඳුනාගත් අතර ඒවා මේ වන තෙක් ම සංවර්ධනය කරමින් විද්‍යානුකුල ප්‍රවේශයන් හඳුනාගෙන ඇත. ඒ සියලු ප්‍රවේශ ප්‍රවේශමෙන් සමාලෝචනය කළහොත් ප්‍රදේශ අතර අසමානතාව ගොඩනැංවීම කෙරෙහි බලපාන ප්‍රධාන ක්‍රියාවලි 3 කි.

1. ආර්ථික කටයුතු සඳහා වඩාත් වාසිදායක ප්‍රදේශ කෙරෙහි තරඟකාරීත්වයක් ඇති වීම. (Competition)

2. ප්‍රදේශ අතර දුර්වල ඒකාබද්ධතාවය (Intergration)

3. ජන සංඛ්‍යාව, නාගරීකරණය, නව තාක්‍ෂණය, භූමි පරිභෝජනය වැනි විවිධ ලක්‍ෂණ වල ව්‍යාප්ත වීමේ රටා (Diffusion)

ඉහත තත්වයන් යහපත් අතට හැරවීම තුළින් ප්‍රදේශ අතර පවතින අසමානතාවය බොහෝ දුරට අවම කළ හැකිය. එහෙත් ප්‍රදේශ වල පවත්නා අසමානතාවයන්ට බෙදා වෙන් කිරීම හෝ බලය බෙදා හැරීම, බලය විමධ්‍යගත කිරීම, බලය කේන්ද්‍රගත කිරීම හෝ බලය මුදා හැර භීතිය පළ කිරීම මගින් ප්‍රදේශ අතර අසමානතා ඉවත් නොවන අතර එසේ සිදු කළ රටවල සිදුවූ විනාශයට උදාහරණ ඕනෑ තරම් ප්‍රමාණයක් සොයා ගත හැකි අතර එකී ක්‍රමවේද බෙහෙවින් අසාර්ථක හා පැවති තත්වය තවදුරටත් බිහිසුණු කිරීමට ද හේතු වී ඇත.

ඒ අනුව ප්‍රදේශ අතර අසමානතා අවම කිරීමෙන් ඒවා ප්‍රකාශ වන ආකාරයක් වළක්වා ගත හැකි අතර ඒ මත අනාගත ශ්‍රී ලංකාව පරිපාලනය විමධ්‍යගත කෙරෙන කාටත් සහභාගි විය හැකි සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශයන්ගෙන් මෙරට අනාගත පරපුරට වත් යහපත් රටක ජීවත්වීමට අවශ්‍ය පරිසරය සකස් කර ගැනීමට උරදීමටත් යහ පාලනය මගින් තිරසාර සංවර්ධනය වෙත ශ්‍රී ලංකාව ප්‍රවේශ කිරීමට ද විද්වත්, වෘත්තික හා ලාංකික අප සැමගේ ද වගකීම වන්නේ ය.

මූලාශ්‍ර

Central Bank of Sri Lanka (2000-2010) Annual Report, Central Bank, Colombo, Sri Lanka

Department of Census and Statistics (2010) Poverty Indicators, Household Income and Expenditure Survey - 2009/10,Ministry of Finance and Planning, Sri Lanka

Department of National Planning (2010) **Sri Lanka,** The Emerging Wonder of Asia; **Mahinda Chintana – Vision for the Future, Ministry of Finance and Planning Sri Lanka**
http://www.mdg.lk/inpages/mdg_reports/2005/mdg_report_2005.htm

http://www.statistics.gov.lk/poverty/PovertyIndicators2009_10.pdf